// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1988/25 - 2016 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2016.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

### සිවිල් ගුවන් සේවා අධිකාරිය

### 196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම

අභ්‍යන්තර කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සේවාවක් (Domestic-Charter Operation), ගුවනේදී සිදු කරන කාර්යයන් (Aerial Work Operation) හා අභ්‍යන්තර විධිමත් ගුවන් ප්‍රවාහන සේවාවක් (Domestic-Regular Public Transport Operation) රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත හා ඊට අදාළ රෙගුලාසි හා කොන්දේසි වලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය සහ බලපත්‍රය ලබා ගැනීම සඳහා කොළඹ 5, කිරුලපන ඇවනිව්, අංක 121/3 හි පිහිටි සකුරායි එවියේෂන් ලිමිටඩ් විසින් 2016 ජූලි මස 5 දාතමින් ඉල්ලුම් පත්‍රයක් 2016 සැප්තැම්බර් මස 6 වන දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පතට අනුව සකුරායි එවියේෂන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

- මල්පේ ගම ඇති රාල්ලාගේ අසංග ප්‍රභාත් යසවර්ධන මහතා
- හපුආරච්චිගේ දොන් නිමල් ජයන්ත මහතා
- වර්ණකුලසූරිය රුෂාන් මලින්ද ප්‍රනාන්දු මහතා

එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම කළමණාකාරිත්වය සඳහා තරංග සරත්චන්ද්‍ර පියවංශ මහතා සකුරායි එවියේෂන් ලිමිටඩ් විසින් නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කොළඹ 02, හුණුපිටිය පාර, අංක 04, සිවිල් ගුවන් සේවා අධිකාරියේ බිම් මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂා කර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) ඇතුලු අනෙකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, සිවිල් ගුවන් සේවා පනත ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත ක්‍රියාමාර්ගයන් (International Standard and Recommended Practices) සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරූපද්‍රිත වූත් ආරක්ෂිත වූත් කාර්යක්ෂම වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල 2016 නොවැම්බර් මස 7 වන දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

1A - G 24358 — 17 (2016/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10 කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනයන කල හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශන වල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතු ය. එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශයට අමුණා තිබිය යුතු ය.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී.

2016 ඔක්තෝබර් මස 14 වැනි දින,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 04, හුණුපිටිය පාර,
කොළඹ 02.

10 - 1669

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.